# බස්නාහිර පළාතේ පළාත් සභා රැස්වීම

## 2016 දෙසැම්බර් මස 29 වන බ්‍රහස්පතින්දා

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි**
**බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණයේ සභා ශාලාවේදී පවත්වන ලද රැස්වීම**

පූ.භා. 09.31 ට සභාව රැස් විය. ගරු සභාපතිතුමා මූලාසනාරූඪ විය.

- **පැමිණීම :**

| | |
|---|---|
| ගරු සුනිල් විජේරත්න | (සභාපතිතුමා) |
| ගරු යසපාල කෝරලගේ | (නියෝජ්‍ය සභාපතිතුමා) |
| ගරු ඉසුර දේවප්‍රිය | (බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ගාමිණී තිලකසිරි | (බස්නාහිර පළාතේ කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු රංජිත් සෝමවංශ | (බස්නාහිර පළාතේ අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ලලිත් වනිගරත්න | (බස්නාහිර පළාතේ මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු සුමිත් ලාල් මැන්දිස් | (බස්නාහිර පළාතේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු සුනිල් ජයමිණි | (සභා නායකතුමා) |
| ගරු ලාලන් සුදත් මංජු ශ්‍රී අරංගල | (විපක්ෂ නායකතුමා) |
| ගරු ගුණසිරි ජයනාත් | (ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |
| ගරු යූ. ජෝර්ජ් පෙරේරා | (විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

අනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා
අනුරාධ විමලරත්න
අනුරුද්ධ ලේකම්ගේ
අසෝක රන්වල
අශෝක දයාරත්න
අමල් සිල්වා
අර්ෂාඩ් නිසාම්ඩීන්
ඇන්ටනී උපුල් රාජිත
ඇ. ශ්‍රීනාත් ම. පෙරේරා
ඉන්දික බණ්ඩාර
ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්
ඊ.ඒ. නන්දන පත්මකුමාර
උදේන විජේරත්න
උපාලි කොඩිකාර
උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ
එම්.එස්.එම්. රහීම්
එස්.ඒ. සමන්මලී සකලසූරිය මැතිනිය
එස්. කුහවරදන්
එස්.එම්. සකාවුල්ලා
කාමල් කුරුප්පු
කිත්සිරි කහටපිටිය
කීර්ති කාරියවසම්
කුරුසාමි කලන්කාඩි තේවර්
කොලන්නගේ වජිර පෙරේරා
කෝකිලා හර්ෂනී ගුණවර්ධන මැතිනිය
ගමගේ නිහාල් ප්‍රේමශාන්ත පෙරේරා
චන්දන ජයකොඩි
ජගත් අංගගේ
ජගත් කුමාර
ජගත් පී. විතාන
ජනක දීපාල් වැලිවත්ත
ජයන්ත ද සිල්වා
ඩී.ඩබ්ලිව්. පුෂ්පකුමාර ද සිල්වා
ඩෝල්ටන් ජානක සූරියබණ්ඩාර
තෙබුවන පියනන්ද හිමි
නිමල් ආර්. පීරිස්
නිමල් චන්ද්‍රරත්න
නිරෝෂ් ඩිල්ෂාන් ජයවර්ධන
නිරෝෂන් පාදුක්ක
නිශාන්ත ශ්‍රී වර්ණසිංහ
නීල් සුනේත්‍රලාල් ප්‍රනාන්දු
පී.ආර්.පී. අබේගුණවර්ධන
පී.ඩී. අබේරත්න
ප්‍රදීප් උඳුගොඩ
ප්‍රදීප් පෙරේරා
බී.පී. ලක්ෂ්මන් ගුණවර්ධන
මල්ෂා කුමාරණතුංග මැතිනිය
මහින්ද ජයසිංහ
මහේෂ් අල්මේදා
මංජුල ප්‍රසන්න සම්පත්
මංජුල බුද්ධදාස
මෙරිල් පෙරේරා
මොහොමඩ් ෆයිරූස්
යූ.එල්.එන්.පී. උඩවෙල
රන්දීර් රොද්‍රිගෝ
රවීන්ද්‍ර යසස් කුමානායක
රවී විජේසේකර
රොජර් සෙනෙවිරත්න
රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්
රොයිස් විජිත
ලක්ෂ්මන් නිපුණ ආරච්චි
ලලන්ත ගුණසේකර
ලලිත් එල්ලාවල
ලලිත් වර්ණකුමාර
ලෙනාඩ් කරුණාරත්න
විජිත් ප්‍රියන්ත
සන්ධ්‍යා සිරිවර්ධන මැතිනිය
සරත් පතිරණ
සලෝචන ගමගේ
සහන් ප්‍රදීප්
සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා
සුමිත් විජයමුණි ද සොයිසා
සුසාර දිනාල්
සුසිල් කිඳෙල්පිටිය
සෙනල් වෙල්ගම
සේනක දමයන්ත ද සිල්වා
ශිරන්ත අමරසේකර
ශ්‍රීනාත් පෙරේරා
හරිස්චන්ද්‍ර කොස්තා
හෙක්ටර් බෙත්මගේ

**නොපැමිණීම :**

**ගරු මන්ත්‍රීවරු**

උදාර රත්නායක
උපාලි ගුණරත්න
ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව
කේ.ඩී. අරුණ දීපාල්
තුවාන් ආමිත් මොහමඩ් අක්රම්
නව්සර් ෆව්සි
නිරෝෂා අතුකෝරල මැතිනිය
මොරිස් විජේරත්න
මොහොමඩ් ෆායිස්
රජිත හපුආරච්චිගේ
රෝස් ප්‍රනාන්දු මෙනෙවිය
ලයනල් ජයසිංහ
සුනිල් වටගල

## 01. ආණ්ඩුකාරවරයාගෙන් ලැබෙන සංදේශ :

*i*

*"කේ.සී. ලෝගේස්වරන් ගරු ආණ්ඩුකාරතුමා වෙත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 'අ' ව්‍යවස්ථාවේ 8(අ) ඡේදය මගින් පවරා ඇති බලතල ප්‍රකාරව 2016 නොවැම්බර් මස 25 වන දින නිකුත් කරන ලද සංවර්ධන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත සලකා බැලීම සඳහා බස්නාහිර පළාත් සභාව 2016 දෙසැම්බර් මස 29 වන දින පෙ.ව. 09.30 ට කැඳවන මෙන් කරන ලද නියෝගය ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී."*

*ii*

*" 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 154 උ ව්‍යවස්ථාවේ (3) අනු ව්‍යවස්ථාව ප්‍රකාරව පළාත් සභාවේ අදහස් ප්‍රකාශ කිරීම පිණිස එවන ලද සංවර්ධන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත සභාවට ඉදිරිපත් කර (2016.12.14 දින සිට) දින 12 ක් ඇතුළත පළාත් සභාවේ අදහස් පිළිබඳ ප්‍රකාශනයක් ආණ්ඩුකාරතුමා වෙත එවන ලෙස දන්වා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී."*

## 02. සභාපතිවරයාගේ නිවේදන :

*i*

*"බස්නාහිර පළාතේ පළාත් සභාවේ ගරු අමාත්‍යවරයෙකු වශයෙන් කටයුතු කළ හිටපු ගරු අග්‍රාමාත්‍ය රත්නසිරි වික්‍රමනායක මැතිතුමා නොබෝදා අප අතරින් වියෝ වූ බව ගරු මන්ත්‍රීවරුන් වෙත ඉතාමත් සංවේගයෙන් දැනුම් දෙන බවත්,*

*එතුමාණන්ගේ අභාවය පිළිබඳව බස්නාහිර පළාත් සභාවේ ශෝකය මෙම අවස්ථාවේදී එම පවුලේ සාමාජිකයන් වෙත පළ කර සිටින බවත්, ඉදිරියේදී සභා සම්ප්‍රදායට අනුකූලව ශෝක ප්‍රකාශ යෝජනාවක් ගෙන ඒමට අවස්ථාව සැලසෙන බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී."*

***අනතුරුව, සභාවේ එකඟතාවය අනුව ගරු මන්ත්‍රීවරු සිය අසුන්වලින් නැඟී සිට විනාඩි දෙකක නිශ්ශබ්දතාවයකින් ශෝකය පළ කරන ලදී.***

## 03. ලිපි ලේඛන පිළිගැන්වීම :

ඉසුර දේවප්‍රිය ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් සංවර්ධන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත සභාවට පිළිගන්වන ලදී.

## 04. කාරක සභා වාර්තා :

2016.12.07, 21 සහ 26 යන දිනයන්හි පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තා ගරු සභාපතිතුමා විසින් පිළිගන්වන ලදී.

## 05. පළාත් සභාවේ කටයුතු : I

සුමිත්ලාල් මැන්දිස් ගරු සභා කටයුතු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*" 2016.12.26 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී ලද එකඟතාවයනට අනුව අද දින [2016.12.29] න්‍යාය පත්‍රයේ සඳහන් පොදු කටයුතු විෂයයේ වැඩ කටයුතු සඳහා කාර්ය පටිපාටි රීති අංක 15(1), 15(4), 57(1), 57(3), 57(4), 57(5), 63අ(3), 88(2) හා 88(3) හි සඳහන් විධිවිධානයන්ගෙන් කිනම් හෝ බාධාවක් සිදු නොවිය යුතු යැයි සලකා ක්‍රියා කළ යුතුය."*

## 06. පළාත් සභාවේ රැස්වීම :

සුමිත්ලාල් මැන්දිස් ගරු සභා කටයුතු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*"අද දින විසිර යෑමෙන් අනතුරුව, 2017.01.17 වන දින පෙ.ව. 09.30 ට මෙම පළාත් සභාව රැස් විය යුතු අතර 2017.01.03 දිනය සභා රැස්වීම් නොපැවැත්වෙන දිනයක් යැයි සලකා ක්‍රියා කළ යුතුය."*

## 07. සංවර්ධන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත :

ඉසුර දේවප්‍රිය - ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරන ලදී.

*"දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 154 උ (3) අනු ව්‍යවස්ථාව යටතේ මෙම බස්නාහිර පළාතේ පළාත් සභාවේ අදහස් ප්‍රකාශ කරනු පිණිස, අතිගරු ජනාධිපතිතුමන් විසින් බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමා වෙත එවනු ලදුව, ගරු ආණ්ඩුකාරතුමා විසින් මෙම පළාත් සභාව වෙත යොමු කරන ලද, "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය - සංවර්ධන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත," මෙම පළාත් සභාවේදී සාකච්ඡා කර පළාත් සභාවේ අදහස් පිළිබඳ ප්‍රකාශනයන් අතිගරු ජනාධිපතිතුමන් වෙත වාර්තා කිරීම සඳහා බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමා වෙත යැවීමට ක්‍රියා කළ යුතු යැයි මෙම පළාත් සභාව අදහස් කරයි."*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***

***පනත් කෙටුම්පත පිළිබඳ ප්‍රශ්නය විමසන ලදින්, 61(3) රීතිය යටතේ පළාත් සභාව පක්ෂව 28 යි, විපක්ෂව 52 යි, වැළකුණු 06 යි යනුවෙන් බෙදුණේය.***

## 08. කල් තැබීමේ යෝජනාව :

සුනිල් ජයමිණි - ගරු සභා නායකතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

ගරු සභාපතිතුමනි, *"දැන් මෙම සභාව කල් තැබිය යුතුය"*

***ඊට අනුකූලව පළාත් සභාව, අ.භා. 01.13 ට, 2017 ජනවාරි මස 17 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***

හේමන්ත සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2016.12.29
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5 වන මහල, බී පර්යන්තය,
සෙත්සිරිපාය, බත්තරමුල්ල.

කුමා/29
Minuts 2016.12.29 - Hansard Section